
# අපේ ගෙවත්තේ සත්ත්ව ලෝකය



ගීත්‍යාවි ගුණවර්ධන



# අපේ ගෙවත්තේ සත්ත්ව ලෝකය

## කතාව නිර්මාණය සහ චිත්‍ර

**ගීත්‍යාවි ගුණවර්ධන**

**මහාමායා බාලිකා විදුහල**

**මහනුවර**

**5 ශ්‍රේණිය B**



**ISBN 978-624-206-756-8**

# පිදුම

මාගේ ආදරණීය

ගුරුතුමියන් හට සහ

මාගේ අම්මා, තාත්තා සහ සහෝදරියට

මෙම පොත

සෙනෙහසින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# හැඳින්වීම

අපේ ගෙවත්තට එන විවිධ සතුන් දෙස බලා ඔවුන්ගේ පින්තූර ගැනීම මගේ විනෝදාශයයි. ඔවුන් කෑම කන, ඇවිදින, කෑ ගසන අයුරු දැක මම සතුටු වෙමි. මෙම පොතේ ඇතුලත් කර ඇත්තේ එසේ ගෙවත්තට එන සතුන් කීපදෙනෙකුගේ විස්තරය.

# සතුන් බලන ක්‍රමය

- ✓ මම ගස් උඩ සිටින කුරුල්ලන් සහ කුරුලු කූඩු දෙස කුඩා  දුරේක්ෂයකින් බලමි
- ✓ බිම සිටින සතුන් ළගට ගොස් බලමි
- ✓ කුඩා සතුන් කොළයකට ගෙන හොඳින් බලමි
- ✓ නපුරු නැති කුඩා සතුන් අතින් අල්ලමි
- ✓ සෑම කෙනෙක්ගේම පින්තූර ගෙන පසුව නැවත බලමි


# පටුන


1. ගෙවත්තේ දී මා දුටු දළඹු වර්ග
2. අපේ ගෙවත්තට එන සමනල්ලු
3. මිදුලේ දී මා දුටු "ලේඩි බර්ඩ්ස්" වර්ග
4. මගේ කුරුළු ලෑල්ල
5. ගොලුබෙල්ලන් කෑමට ගන්නා ඇටි කුකුළා
6. කුරුළු කූඩුව රිලවු කඩපු දවස
7. ගෙවත්තේ දී මාහට ගොඩක් දුක සිතුන දා
8. නිවසේදී මා දුටු විශාල ගස් ගෙම්බා
9. නිවසේදී මිය යන හංගොල්ලෝ,
   ගොලුබෙල්ලෝ සහ ගෙම්බෝ

# ගෙවත්තේ දී මා දුටු දළඹු වර්ග




මිදුලේ වතුසුදු ගහේ සිටි කොළ සහ දුඹුරු පාට මෙම දළඹුවන්ගේ ඇස් දෙක ඉතා විශාලය.



මල් පෝච්චියේ කූඩලු
ගහේ සිටි මෙම ලා දුඹුරු
පාට දළඹුවා රබර් කෑල්ලක්
වගෙයි.



බතල වැලේ සිටි තැඹිලි පාට මෙම දළඹුවාට බුහු රාශියක් තියෙනවා.




මල්බෙරි පත්‍ර වල කුඩා කොළ පාට දළඹුවන් රාශියක් දුටුවෙමි.

# අපේ වත්තට එන සමනල්ලු



අපේ ගෙවත්තට එන විවිධ වර්ග වල සමනල්ලු බොහෝ විට තනි තනිව හෝ දෙදෙනෙකු ලෙස පැමිණේ.

# මිදුලේදී මා දුටු "ලේඩිබර්ඩ්ස්" වර්ග



රතු, තැඹිලි, කහ, කොළ, කලු
තිත් සහිත වර්ග



කොළ, කලු සහ දුඹුරු පාට බෝලයක් වැනි වර්ග



කොළ පාට
මෝස්තර සහිත වර්ගයකි



මෙම "ලේඩිබර්ඩ්" වර්ගය කහ
පාට වතුර බිංදුවක් වැනිය

# අපේ කුරුලු ලෑල්ල




ලේන්නු, පරවියෝ, කොණ්ඩ කුරුල්ලෝ නිතරම අපේ කුරුලු ලෑල්ලෙන් කෑම කති. මීයෝ බිමට වැටෙන කෑම කති.

# ගොලුබෙල්ලන් කෑමට ගන්නා ඇටි කුකුලා




**අපේ මිදුලට එන ඇටි කුකුලා ගොලුබෙල්ලන් කෑමට ගන්නවා මම නිතර දකින්නෙමි.**

# නිවසේ දී මා දුටු විශාල ගස් ගෙම්බා




සමහර දින වල රෑට අපේ නිවස ඇතුලට එන මෙම ගස් ගෙම්බාට වේගයෙන් බිත්ති දිගේ ඇවිදීමේ හැකියාව ඇත.

# නිවසේ දී මියයන හංගොල්ලෝ සහ ගෙම්බෝ



තද අව්ව දින වලදී ගේ ඇතුලට එන හංගොල්ලෝ, ගොලුබෙල්ලෝ සහ කුඩා ගෙම්බෝ පසුව ගේ ඇතුලේදී මිය ගොස් සිටින බව මම දැක ඇත්තෙමි.

# කුරුළු කූඩුව රිලවු කඩපු දවස



වෙරලු ගසේ අත්තක තිබූ කුරුළු කූඩුව රිලවු
කැඩූ  දවසේ මට ගොඩක් දුක හිතුනා.

# ගෙවත්තේ දී මා හට ගොඩක් දුක හිතුණු දා



අපේ ගරාජ් එකේ කණුවක සාදා තිබුණු කොබෙයියන්ගේ කූඩුවෙන් පැටියෙක් එතන යට තිබුනු පොකුණට වැටී මිය ගිය දවසේ මට ගොඩක් දුක හිතුනා. අපි ඊට පසුව පොකුණට දැලක් දැම්මා.

# අපි සත්තුන්ට ආදරය කරමු...



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01